**කහටගස්දිගිලිය ප්‍රාදේශීය සභාව**

**අනුරාධපුර දිස්ත්‍රික්කය**

1. **මූල්‍ය ප්‍රකාශන**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2013 මැයි 03 දිනද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2012 අප්‍රේල් 05 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2013 ජූලි 09 දින සභාවේ සභාපතිවරයාට යවා ඇත.

1.2 **මතය**

මාගේ පරික්ෂණයෙන් පෙනීයන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු හා පැහැදිලි කිරීම් අනුව කහටගස්දිගිලිය ප්‍රාදේශීය සභාවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මාගේ වාර්තාවේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම හැර 2012 දෙසැම්බර් 31 දිනට කහටගස්දිගිලිය ප්‍රාදේශීය සභාවේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ ප්‍රකාශ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

1.3 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

1.3.1 **ගිණුම්කරණ අඩුපාඩු**

(අ). සමාලෝචිත වර්ෂයේදී පරිත්‍යාග වශයෙන් ලැබුණු එකතුව රු.433,465 ක්වූ පුස්තකාල පොත් වටිනාකම හා තවත් කාර්යාල උපකරණ විෂයයන් 20 ක් අගය කර ගිණුම්ගත කර නොතිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී මිලදීගත් වටිනාකම වූ රු.55,200 ක් වූ යන්ත්‍ර හා උපකරණ පුනරාවර්තන වියදමක් වශයෙන් ගිණුම්ගත කර තිබුණි.

(ආ). ආසියානු සංවර්ධන බැංකුවෙන් ණය වශයෙන් ලබා ගන්නා ලද රු.4,282,862 ක ණය මුදලක් ලෙස ගිණුම්ගත කර නොතිබූණු අතර සමාලෝචිත වර්ෂයේදී ගෙවන ලද පොලිය සහ ණය වාරික එකතුව රු.773,532 ක් සාවද්‍ය ලෙස මූලධන වැය යටතේ දක්වා තිබුණි.

**1.3.2 නොසැසඳු ගිණුම්**

මූල්‍ය ප්‍රකාශන අනුව ලැබිය යුතු උසාවි දඩ ආදායම රු.788,993 ක්වූ අතර උපයෝගි ලේඛන/වාර්තා අනුව එම ශේෂය රු.517,739 ක් විය.

**1.3.3 විගණනය සඳහා සාක්ෂි නොවීම**

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු. 19,946,919 ක්වූ ගිණුම් විෂයයන් 05 ක් විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

**02. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 3,024,538 ක්වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 182,202 ක් විය.

**2.2 ආදායම් පරිපාලනය**

**2.2.1 ඇස්තමේන්තුගත ආදායම්,තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්**

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබු ඇස්තමේන්තුගත ආදායම්,තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු.'000 | රු.'000 | රු.'000 |
| (i). | වරිපනම් හා බදු | 609 | 796 | 425 |
| (ii). | බදු කුලී | 349 | 3,492 | 207 |
| (iii). | බලපත්‍ර ගාස්තු | 956 | 844 | 43 |
| (iv). | වෙනත් ආදායම් | 628 | 5,435 | 1,021 |

### 2.2.2 වරිපනම් හා බදු

2012 දෙසැම්බර් 31 දිනට වූ රු.425,412 ක හිඟ ශේෂයක් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

### 2.2.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2012 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබුණු මුද්දර ගාස්තු ආදායම රු. 941,300 ක්වූ අතර එදිනට ලැබිය යුතු උසාවි දඩ ආදායම නිශ්වය කර ගිණුම්ගත කර නොතිබුණි.

### 2.3 නිශ්ක්‍රීය හා ඌණ උපයෝජිත භෞතික සම්පත්

සහල් පිටි ආශ්‍රිත බේකරි නිෂ්පාදන ප්‍රචලිත කිරීම සඳහා 2008 වර්ෂයේදී සභාවට ලැබුණු වටිනාකම රු.541,000 ක්වූ උපකරණ සහ ඒවා ස්ථාපිත කිරීම සඳහා ගොඩනැඟිලි අළුත්වැඩියා කිරීම වෙනුවෙන් රු.297,719 ක් වැයකර තිබුණු නමුත් සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් කිසිදු නිෂ්පාදන කාර්යයක් ආරම්භ නොකර අදාල උපකරණ නිශ්ක්‍රිව පැවතුණි.

### 2.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

(අ). සමාලෝචිත වර්ෂයේදී 1987 අංක 15 දරන ප්‍රාදේශිය සභා පනතේ 19(1) වගන්තියේ විධිවිධාන අනුව පළාත් පාලන කොමසාරිස්ගේ අනුමැතිය ලබා නොගෙන තනතුරු 15 ක් සඳහා ස්ථිර කාර්ය මණ්ඩලය බඳවාගෙන රු.2,076,501 ක් වැටුප් හා දීමනා වශයෙන් සභා අරමුදලින් ගෙවා තිබුණි.

(ආ). ඉදිරි වර්ෂවල ක්‍රියාකාරිත්වයට අදාල සැලසුම් ඇතුළත් සංයුක්ත සැලැස්මක් හා ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත කාර්යයන් ඉටු කිරීම සඳහා ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර ක්‍රියාත්මක කර නොතිබුණි.

## 2.5 අවිධිමත් ගනුදෙනු

සභා අරමුදල භාවිත කරමින් එකතුව රු.105,860 ක වටිනාකම වූ උදලුතල හා ප්ලාස්ටික් පුටු මිලදීගෙන තිබුණු නමුත් එකී භාණ්ඩ බෙදාදුන් ආකාරය විගණනයට පැහැදිලි නොකෙරුණි.

## 03. පද්ධති හා පාලන

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ). ගිණුම්කරණය

(ආ). ආදායම් පරිපාලනය

(ඇ). වත්කම් කළමනාකරණය